පොදු චක්‍රලේඛ 02/2024

මගේ අංකය- DCDSP/02/22/04
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,
ගාල්ල.
2024.01. 24

සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
ප්‍රධාන කාර්යාලය/ගාල්ල / මාතර / හම්බන්තොට.

**විවිධ ආරවුල් විභාග කිරීම සඳහා සතියේ රාජකාරී දින යොදා ගැනීම.**

උක්ත ශීර්ෂගත මාගේ අංක දපස/සමු/සං/50/ix/04/ii/චක්‍රලේඛ හා 2008.04.17 දිනැති ලිපිය හා බැදේ.

02. එකී ලිපිය මගින් තීරක ආරවුල්(විවිධ) විභාග කිරීම සඳහා සතියේ සඳුදා හා බදාදා යන දිනයන් හැර මසකට උපරිම රාජකාරි දින දෙකක් පෞද්ගලික නිවාඩු ලබා ගෙන බේරුම්කරණ විභාග කටයුතු සිදු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.

03. කෙසේ වුවද සමූපකාර සමිති පනතේ 58 වගන්තිය යටතේ ඔබ වෙත යොමුවී බේරුම්කරුවන් වෙත යොමු කරන විවිධ ආරවුල් සම්බන්ධයෙන් තීන්දු ලබා දීමේදී ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බව නිරීක්ෂණය වන අතර, ආරවුල් විභාග සඳහා අනෙකුත් රාජකාරී අතර පෞද්ගලික නිවාඩු ලබා ගැනීමට ඇති නොහැකියාව ඊට හේතුවී ඇති බව මා වෙත කරුණු වාර්තාවී ඇත.

04. එබැවින් 2024.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තීරක විභාග (විවිධ) ආරවුල් බේරුම්කරුවන් වශයෙන් කටයුතු කිරීම සඳහා මසකට උපරිම දින 01 ක් රාජකාරී නිවාඩු ලබාදීමට මින් අනුමැතිය ලබා දෙමින් මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද මාගේ අංක දපස/සමු/සං/50/ix/04/ii/චක්‍රලේඛ හා 2008.04.17 දිනැති ලිපිය මින් අවලංගු කරමි.

05. එම රාජකාරී නිවාඩු පහත කොන්දේසි යටතේ ලබාගැනීමට නිලධාරීන් කටයුතු කලයුතු බව අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන් වැඩිදුරටත් මෙයින් උපදෙස් ලබා දෙමි.

I. මසකට දින එකක් උපරිමව රාජකාරී නිවාඩු ලබාගත හැකි වන අතර, අදාල තහවුරු කිරීම් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත යොමු කර එම නිවාඩු සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

II. සතියේ සඳුදා හා බදාදා යන දිනයන් මේ සඳහා යොදා නොගත යුතුය.

III. අදාල රාජකාරී නිවාඩු විවිධ ආරවුල් විසඳීම සඳහා පමණක් අදාල කර ගත යුතුය.

කේ.පී.ජී. සුමිත් ශාන්ත,
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

කේ.පී.ජී. සුමිත් ශාන්ත
සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත :- සියළුම බේරුම්කරුවන් - කාරු. දැ.පි හා පූර්ව අනුමැතිය ලබා ගෙන රාජකාරී නිවාඩු ලබා ගැනීම සඳහා.